# මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසිකව) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරු | 01 | රු. 27,140-10 X 300-11 X 350-10 X 495-10 X 660- රු. 45,540 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06 කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 24250-10X250-10X270-10X300 - 12 X 330 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. පෙර පාසැල් ගුරු තනතුර සඳහා වයස අවුරුදු 18ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය.
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.)
4. අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබුවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතුය.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (එහෙත් මේ පිළිබඳ රජයේ ප්‍රතිපත්ති තීරණයට ඔබ යටත් විය යුතුය.)
2. පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ.
3. වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
4. මෙම බඳවාගැනීමේදී කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ. පෙර පාසැල් ගුරු තනතුර සඳහා ලිඛිත විභාගයක් පැවැත්වේ.
2. අයදුම්පත්‍රය සමග සහතික සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
4. මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකය,
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,
6. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුරට අදාල කවරයේ වම්පස ලියා 2018.04.16 වැනි දිනට පෙර ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී මහර ප්‍රාදේශීය සභාව පහළ කරගහමුණ කඩවත යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහර ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ මාර්තු මස 14 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහල කරගහමුණ,
කඩවත.

## මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රජ්‍ය සේවයේ ........................................................................ තනතුර සඳහා බඳවා ගැනීම.

1. මුලකුරු සමග නම :______________________.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :______________________.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :______________________.
3. ස්ථිර ලිපිනය :______________________.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :______________________.
5. උපන් දිනය :______________________.
   2018.04.16 දිනට වයස අවුරුදු :__________ මාස:__________ දින :__________
6. ජාතික හැඳුනුම්පත් අංකය :______________________.
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ ලියාපදිංචි වීමෙන්ද ? :______________________.
8. දුරකථන අංකය :______________________.
9. (i) අධ්‍යාපන සුදුසුකම් :______________________.

   (ii) අ.පො.ස (සා.පෙළ) :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

   (iii) අ.පො.ස (උසස් පෙළ) :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

10. වෙනත් සුදුසුකම් :______________________.

11. සේවා පළපුරුද්ද :______________________.

   (I) දැනට දරන තනතුර :______________________
   (II) එම තනතුරට පත්වූ දිනය :______________________
   (III) එම තනතුරෙහි සේවා කාලය :______________________
   (IV) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :______________________

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

.........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :__________ .

### දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ අත්සන

මෙම ඉල්ලුම්කරු වන ............................................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ ................................................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/ නොකරමි.

____________________.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :_______________.

03-1228